## 433 රැයක අඳුර

රැයක අඳුර දුරු වෙලා මුළුම අහස තරු වෙලා
පොඩි තරුවක් හිරු වෙලා මහඟු මඟුලෙකී
කුරුලු රංචු ඇහැරිලා මල් සීනට ඇහැරිලා
හැම තැන හිම ඉහිරිලා මහඟු මඟුලෙකී

සීතත් ඇත ගීතත් ඇත
රැයකුත් ඇත ගෙයකුත් නැත
ගව්වක් දුර යන්ටත් ඇත
දරුවකු සොයලා
සැනසුම නැත උණුසුම නැත
මව් රුවනට පුතකුත් ඇත
යමු යන්නට ගොස් එන්නට
මේ පුත බලලා

වැසි පොද පොඩි මුතු වගෙයි කෝටි හතක හතු වගෙයි
මුතු කුඩයක හැඩ වගෙයි අහස පෙනෙන්නේ
සුවඳ වහිනවා වගෙයි මිහිර බහිනවා වගෙයි
ගඟක් හැදෙනවා වගෙයි සුවඳ ගලන්නේ

බෙත්ලෙහෙමේ පොඩි පුතා සිටියි අහුරකට ඔතා
සිඟිති සිතුම් සිත සිතා ඇඟිලි උරන්නේ
මවට ඇසින් කර කතා දරු හුරතල් පත පතා
ඇඟිලි එකට ගොත ගොතා මැණික් ගරන්නේ